# ත්‍රිපිටකාගත වර්ගීකරණය පිළිබඳ පුස්තකාල වර්ගීකරණ සිද්ධාන්ත ඇසුරින් කරනු ලබන විග්‍රහයක්

- වෑවල ධම්මාලෝක හිමි

## 1. සාරාංශය:

මෙම ලිපියේ මූලික අරමුණ වන්නේ පුස්තකාල වර්ගීකරණ සිද්ධාන්ත අනුව ථෙරවාද ත්‍රිපිටකාගත වර්ගීකරණ ක්‍රමය පිළිබඳ විමසීමක් කිරීම යි. පුස්තකාල වර්ගීකරණයේ ඇති භාව තලය, වාග් තලය හා අංකන තලය යන අවස්ථා තුන භාවිත කොට ත්‍රිපිටකාගත වර්ගීකරණය විමසා ඇත. ශත වර්ෂ ගණනාවක් කාල-දේශ වශයෙන් බුද්ධ දේශනාව ආරක්ෂා කිරීමේ දී දැනුම සංවිධාන උපක්‍රමයක් ලෙස වර්ගීකරණ ක්‍රමය නිවැරදි අවබෝධයකින් භාවිත කිරීමට බුදුන් වහන්සේ ගේ ශ්‍රාවකයන් සමත් වී ඇත යන උපකල්පනය මත පිහිටා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙහි දී එස්.ආර්. රංගනාදන් විසින් ඉදිරිපත් කළ පුස්තකාල වර්ගීකරණ සිද්ධාන්තවලින් කිහිපයක් ත්‍රිපිටකාගත වර්ගීකරණයේ ස්වභාවය අනුව අදාළ කර ගන්නා ලදී. ත්‍රිපිටකාගත මූල ග්‍රන්ථ මෙන් ම අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ලියා ඇති විවිධ මට්ටමේ මූලාශ්‍රය පරිහරණයෙන් ලබා ගන්නා ලද දත්ත හා තොරතුරු සංසන්දනාත්මක ව විශ්ලේෂණය කොට මෙම තේමාව පරිපෝෂණය කරන ලදී. ත්‍රිපිටකාගත වර්ගීකරණය පුස්තකාල වර්ගීකරණ සිද්ධාන්ත අනුව විමසිය හැකි මනා අවබෝධයකින් සිදු කරන ලද බොහෝ දුරට සංවර්ධිත වර්ගීකරණ ක්‍රමයක් බව නිගමනය කළ හැකි ය.



## 2. හැඳින්වීම:

පුස්තකාලවල ග්‍රන්ථ සංවිධානය කිරීමේ ප්‍රධාන උපක්‍රමය වර්ගීකරණය යි. දැනුම නාමකරණය, නිර්වචනය, විශ්ලේෂණය, සාමාන්‍යකරණය, වෙන්කර හඳුනා ගැනීම, ප්‍රකට කිරීම, කාණ්ඩ කිරීම, ප්‍රේරණය, බෙදා වෙන් කිරීම, අනන්‍යකරණය, සැසඳීම, තේරීම, සාම්පලකරණය, පෙළ ගැස්වීම, කේතකරණය, සිතියම් කිරීම, ව්‍යුහගත කිරීම, සංවිධානය හා පාලනය යන ක්‍රියාවලින් වර්ගීකරණයට අයත් වේ. සිංහලෙන් "වර්ගීකරණය" යන අරුත දෙන "classification" යන ඉංග්‍රීසි වදන සෑදී ඇත්තේ "සමාජ පංතිය" යන අරුත ඇති "classis" යන ග්‍රීක වචනයෙනි. පුරාතන රෝමයේ සමාජ කණ්ඩායම්වල උස්-පහත්කම් පෙන්වීමට එම කණ්ඩායම්වල සමාජිකයන් ගේ රුධිරයට අයත් යැයි සිතන ලද ගති ලක්ෂණ හා ධනවත්කම පිළිබඳ සාධක පදනම් කර ගන්නා ලදී. මෙයින් සමාජය උසස් පංති හා පහත් පංති යැයි වර්ගීකරණය කිරීමට හැකි විය. එයින් එක ම පංතියකට අයත් සමාන ගති ලක්ෂණ දරන්නවුන් හඳුන්වන ලද්දේ "classis" යන වචනයෙනි. "සමාජ පංති" පදනම් කර ගෙන වර්ගීකරණයක් සිදු වූ බවට භාරතීය වර්ණ භේදය ද සාක්ෂි දරයි.

එසේ ම මිනිසා ගේ ඉගෙනීම් ක්‍රියාවලිය, දැනුමේ සංවර්ධනය, දැනුම බෙදා හැරීම යනාදී ක්‍රියාවලින් කෙරෙහි වර්ගීකරණයේ බලපෑම ඉතා වැදගත් ය. වර්ගීකරණය මිනිසා සතු සහජ මානසික ක්‍රියාවලියක් ද වේ. මේ නිසා වර්ගීකරණය තර්ක ශාස්ත්‍රය, මනෝ විද්‍යාව, දර්ශනය, ඥාන විභාගය, වාග් විද්‍යාව, සූචිකරණය, පුස්තකාල හා විඥාපන විද්‍යාව ආදී අධ්‍යයන ධාරාවන්ට පහසුවෙන් සම්බන්ධ වන අන්තර් විෂයක් බවට පත් වී ඇත.[1] වර්ගීකරණය භාවිත කරමින් පුස්තකාලවල ග්‍රන්ථ එකතු සංවිධානය කරනු ලැබේ. එමගින් පොත් පත්, තොරතුරු, දැනුම වෙත උපයෝජකයනට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වේ. "පොත් ඇත්තේ භාවිතය සඳහා ය, සෑම

පොතකට ම පාඨකයෙක්, සෑම පාඨකයෙකුට ම පොතක්, පාඨකයා ගේ කාලය ඉතිරි කළ යුතු ය" යන ආචාර්ය එස්. ආර්. රංගනාදන් විසින් ඉදිරිපත් කළ පුස්තකාල විද්‍යා නීති යථාර්ථයක් කිරීමේ දී වර්ගීකරණය මූලික හා අත්‍යවශ්‍ය ක්‍රමවේදයක් වේ. ග්‍රන්ථ සංවිධාන ක්‍රමයක් වශයෙන් වර්ගීකරණය භාවිත කිරීම පටන් ගන්නා ලද්දේ දහ නව වැනි සියවසේ පමණ බටහිර රටවල දී ය. ඒ අනුව නූතන පුස්තකාල වර්ගීකරණ ක්‍රම නිර්මාණය වී ඇත්තේ ඉතා මෑත කාලයේ බව පැහැදිලි වේ. එහෙත් දැනුම වර්ගීකරණයට පුස්තකාල වර්ගීකරණයට වඩා දිගු ඉතිහාසයක් හිමි වේ. ග්‍රීක යුගයේ පටන් බටහිර දාර්ශනිකයෝ දැනුම වර්ගීකරණය කිරීමේ ක්‍රම ලොවට හඳුන්වා දුන්හ. දැනුම යනු කුමක් ද? දැනුම බිහි වන්නේ කෙසේ ද? යනාදී ගැටලු මෙම දැනුම වර්ගීකරණ ක්‍රම බිහි වීමට පදනම් වී ය.

### 3. භාරතීය දැනුම වර්ගීකරණය:

ත්‍රිපිටක වර්ගීකරණය අහඹු ලෙස නිර්මාණය වූවක් නො වේ. දැනුම වර්ගීකරණයේ දිගු ඉතිහාසයක් භාරතයේ දැකිය හැකි ය. බටහිර ඉතිහාසය හා සැසඳීමේ දී භාරතීය වර්ගීකරණ ඉතිහාසය ක්‍රි.පූ. හය වැනි සියවසෙන් ඔබ්බට දිව යන බව පැහැදිලිව පෙනේ. රෝමයේ මෙන් ම ඉතා ප්‍රබල සමාජ පංති වර්ගීකරණයක් භාරතයේ ද පැවැතිණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් දක්වන ලද මේ සමාජ බෙදීම ආගමික කරුණු මත පිහිටා සිදු කරන ලද්දකි. වෛදික යුගයේ දී දැනුම මිනිසාගේ ජීවන පරමාර්ථ අනුව විවිධාංගීකරණය කරන ලදී. උපනිෂද්වල මිනිසාගේ සංකල්ප ලෝකය ධර්ම, අර්ථ, කාම, මෝෂ යන අවස්ථා සතරකට බෙදා දක්වා ඇත. මෙය භාරතීකය දැනුම වර්ගීකරණයේ වැදගත් අවස්ථාවක් ලෙස සැලකේ. මේ බෙදීම අනුව "ධර්ම" යන වර්ගය අයත් වූයේ සමාජ සංවිධානයට හේතු වන විෂයන් ය. නීතිය, දේවධර්මය, ආචාරවිද්‍යාව සහ සමාජවිද්‍යාව එයට අයත් විය. සමාජ



සුභසාධනයට හේතු වන විෂයන් "අර්ථ" ලෙස වර්ග කරන ලදී. ඉතිහාසය, දේශපාලනය, අර්ථශාස්ත්‍රය සහ ව්‍යවහාරික විද්‍යා මෙම විෂයන් අතර විය. "කාම" යනුවෙන් වර්ග කරන ලද්දේ මිනිසාගේ නිර්මාණාත්මක හැකියාවන් ය. සාහිත්‍ය, කලාව, ගණිතය හා ශුද්ධ විද්‍යා මීට අයත් විය. මිනිසා සමාජයේ පුද්ගලයෙකු වශයෙන් ලත් ආධ්‍යාත්මික හෝ විශිෂ්ඨතම අද්දැකීම් "මෝක්ෂ" නම් විය. දර්ශනය, ආගම හා ආධ්‍යාත්මික විද්‍යාවන් මේ වර්ගයට අයත් විය.[2]

ත්‍රිපිටකාගත වර්ගීකරණය නිර්මාණය වීම සඳහා මෙම වෛදික වර්ගීකරණවල බලපෑම නිසැකව ලැබෙන්නට ඇත. ක්‍රි.පූ. හය වන සියවසේ දී බුදුන් වහන්සේ ගේ ශ්‍රාවකයන් විසින් උන්වහන්සේ ගේ ඉගැන්වීම් සම්භාරය සංවිධානය කිරීම සඳහා භාවිත කළ ක්‍රමවේදය මෑත කාලයේ නිර්මාණය වූ පුස්තකාල වර්ගීකරණ ක්‍රමවේදවලට ද බොහෝ දුරට සමාන වේ. පාළි ත්‍රිපිටකයේ දක්නට ලැබෙන වර්ගීකරණය පුස්තකාල වර්ගීකරණ සිද්ධාන්ත අනුව කිසියම් දුරකට විමසා බැලීම මේ ලිපියේ අරමුණ යි.

### 4. ත්‍රිපිටක වර්ගීකරණය:

ත්‍රිපිටකය යනු බුදුන් වහන්සේ ගේ දේශනා සම්භාරය සංවිධානය හා ආරක්ෂා කිරීමේ අරමුණින් නිර්මාණය කරන ලද සාහිත්‍ය සංග්‍රහයකි. ආගමික ග්‍රන්ථයක් හැරුණු විට එය තොරතුරු අවශ්‍යතා ඇත්තවුන් ගේ ප්‍රයෝජනයට සම්පාදනය කර ඇති ඇති නූතන විශ්ව කෝෂයකට හෝ වෙනත් විමර්ශන ග්‍රන්ථයකට හෝ සමාන කළ හැකි ය. විමර්ශන ග්‍රන්ථයක ලක්ෂණය වන්නේ නියත විෂයකට අදාළ සමස්ථ දැනුම් සම්භාරය උපයෝජකයා ගේ අරමුණ අනුව පහසුවෙන් සමුද්ධරණය කර ගැනීමට හැකි වන පරිදි වර්ගීකරණය කිරීමෙන් හෝ අනුක්‍රමණිකාගත කිරීමෙන් හෝ සංවිධානය කොට තිබීම යි. නියම තොරතුර නියම පුද්ගලයාට, නියම ආකාරයෙන් ඉතා

ඉක්මනින් ලබා දීම විමර්ශන ග්‍රන්ථයක අරමුණ වේ. විමර්ශන කෘතියකට මෙය කළ හැකි වන්නේ අන්තර්ගතයේ තොරතුරු සංවිධානය කිරීම සඳහා වර්ගීකරණය භාවිත කිරීමෙනි. බුද්ධ දේශනාවන් සංවිධානය කිරීමේ දී ද උන්වහන්සේලා මෙවැනි අරමුණු ඉටු කර ගැනීමට බලා පොරොත්තු වන්නට ඇත. මේ සඳහා සංගීතිකාරකයන් විසින් භාවිත කළ ක්‍රමවේද කවරේ ද? යන්න පිළිබඳ විමසා බැලීම සූත්‍රාදිය විමර්ශනය කරන භික්ෂුවට වැදගත් කාරණයකි. අටුවා ඇදුරන් ද ත්‍රිපිටකයේ වර්ගීකරණය යම් ප්‍රමාණයකට විමසීමට ප්‍රයත්නයක් දරා ඇති බව පෙනේ. ඒ අනුව ත්‍රිපිටක වර්ග පංතිවල ස්වභාවය, සංයුතිය, අර්ථකථනය, විශ්ලේෂණය ආදිය පිළිබඳ විස්තර පාලි අටුවාවල නොයෙක් තැන දක්වා ඇත. එසේ ම අටුවාවල තොරතුරු පෙළ ගැස්වීමේ දී ත්‍රිපිටක වර්ගීකරණයේ රටාව ම අනුගමණය කොට ඇති බව පැහැදිලි ය.

## 5. පුස්තකාල වර්ගීකරණය:

පුස්තකාල වර්ගීකරණ පද්ධති නිර්මාණයේ දී පදනම් වන සිද්ධාන්ත රාශියක් එස්. ආර්. රංගනාදන්, බර්වික් සේයර්ස්[3] වැනි කීර්තිමත් පුස්තකාල වර්ගීකරණඥයන් විසින් හඳුන්වා දී තිබේ. ත්‍රිපිටකාගත වර්ගීකරණය විමසා බැලීමේ දී අපට පැහැදිලි වන්නේ වර්ගීකරණ සිද්ධාන්ත අනුව සලකා බැලිය හැකි තරමේ විෂය පිළිබඳ අවබෝධයක් සංගීතිකාරයන් තුළ ද පැවැති බව යි. ආචාර්ය එස්. ආර්. රංගනාදන් (1892-1972) විසින් සංග්‍රහකරණ ලද වර්ගීකරණ සිද්ධාන්ත ඕනෑම වර්ගීකරණ පද්ධතියක් විමසා බැලීමට සුදුසු ය. ඔහුගේ *Philosophy of Library Classification*, (1950) සහ *Prolegomena to Library Classification, 3rd ed., (1967)* යන කෘති වලින් මෙම සිද්ධාන්ත සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී. මේ අතර වර්ගීකරණ සිද්ධාන්තවල මූලික සංකල්ප කිහිපයක් පමණක් අදාල කර ගෙන ත්‍රිපිටක වර්ගීකරණය විමසා බැලීමට ප්‍රයත්න දරනු ලැබේ.



සියල්ලට පළමුව, වර්ගීකරණයක් කිරීම සඳහා ප්‍රමාණවත් සාහිත්‍යයක් තිබි යුතු වේ. බෞද්ධ සාහිත්‍යට බුද්ධ වචයෙන් පටන් ගෙන ත්‍රිපිටකය ඔස්සේ අටුවා, ටීකා, ප්‍රකරණ සමගින් වර්තමානයේ නාට්‍ය, සංගීතය, නවකතාව හා අන්තර්ජාල වෙබ් අඩවි ආදී විද්‍යුත් ප්‍රකාශන දක්වා විකාශනය වූ දැවැන්ත සාහිත්‍ය ප්‍රවාහයක් ඇතුළත්ව තිබේ. එම සාහිත්‍ය මුල් කාලයේ දී ස්මෘතිගත වාචික දේශනා හා පුස්කොළ පොත් වශයෙන් පැවැතිණි. වර්තමාණයේ එම දැනුම මුද්‍රිත පොත්, කඩදාසි අත්පිටපත්, ලිපි, වාර්තා, සඟරා හා ශ්‍රව්‍ය දෘශ්‍ය විද්‍යුත් මාධ්‍ය ස්වරූපයෙන් විවිධ භාෂාවලින් ලොව විවිධ රටවල පුස්තකාලවල ඒකරාශි කෙරෙමින් පවතී. එක් එක් විෂයයන් සඳහා ඊට අයත් එකතු සංවිධානය කිරීමට විශේෂ පුස්තකාල වර්ගීකරණ පද්ධති නිර්මාණය කර ගෙන ඇත. එහෙත් මේ දක්වා මෙවැනි පුලුල් සාහිත්‍යයක් සංවිධානය කිරීම සඳහා විශේෂිත පුස්තකාල් වර්ගීකරණ පද්ධතියක් නිර්මාණ නොවීම අඩු පාඩුවකි. බුද්ධ වචනය සංවිධානය කිරීමේ දී සංගීතිකාරක තෙරුන් විසින් ලබා දුන් අතීත ආදර්ශය පිළිබඳ හැදෑරීම මේ නිසා වැදගත් ය. ත්‍රිපිටක වර්ගීකරණය පිළිබඳ සිදු කරන මෙවැනි අධ්‍යයන කාලීන අවශ්‍යතාවන්ට සරිලන බෞද්ධ වර්ගීකරණ පද්ධතියක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමකට හේතු වේ.

## 6. දැනුම වර්ගීකරණය:

දැනුම වර්ගීකරණය හා පුස්තකාල වර්ගීකරණය යනුවෙන් වර්ගීකරණ ඉතිහාසයේ අවස්ථා දෙකක් හඳුනා ගත හැකි ය. පුස්තකාල වර්ගීකරණ පද්ධති නිර්මාණය වීම කෙරෙහි කලින් පැවැති ඥාන වර්ගීකරණ ක්‍රමවල බලපෑම ඉතා වැදගත් වී ය. අතීතයේ පටන් දාර්ශනිකයෝ හා ගුරුවරු විශ්ව ඥානය වර්ගීකරණය කිරීම මූලික කාර්යයක් ලෙස පිළිගත්හ. පුස්තකාල වර්ගීකරණ නිර්මාණය වීමට පදනම් වූයේ මෙම අතීත දාර්ශනික

වර්ගීකරණ ක්‍රම යි.[4] මුල් කාලයේ දී පුස්තකාලවල එක්රැස් කළ ලේඛන ද්‍රව්‍ය ඒවායේ භෞතික ලක්ෂණ අනුව වර්ග කරන ලදී. කර්තෘන් ගේ නාම, පොතේ ප්‍රමාණය, වර්ණය ආදිය වර්ගීකරණයට පදනම් වූ සාධක අතර විය.[5] මේ ආකාරයේ වර්ගීකරණ ක්‍රම තොරතුරු ගවේෂණයේ දී උපකාර වන සාර්ථක ක්‍රම නො වී ය. දහ නව වැනි සියවස වන විට පුස්තකාලවල ග්‍රන්ථ වර්ගීකරණය පිළිබඳ වැඩි අවධානයක් යොමු කොට තිබූ අතර අන්තර්ගතය නො සලකා භෞතික ගතිලක්ෂණ අනුව පුස්තකාලවල පොත් පත් පෙළ ගැස්වීමේ ඇති ගැටලු හඳුනා ගන්නා ලදී. මේ නිසා පුස්තකාලවේදීහු විෂය නොහොත් දැනුම වර්ගීකරණය පදනම් කර ගත් පුස්තකාල වර්ගීකරණ පද්ධති නිර්මාණය කෙරෙහි අවධානය යොමු කරන්නට පටන් ගත්හ.

දහ නව වැනි සියවසේ මුල දී තෝමස් ජෙෆර්සන් ග්‍රන්ථ වර්ගීකරණයක් සම්පාදනය කිරීම සඳහා ප්‍රැන්සිස් බේකන් ගේ දාර්ශනික වර්ගීකරණය පදනම් කර ගත්තේ ය. එම වර්ගීකරණ ක්‍රමය ඇමරිකානු කොංග්‍රස් පුස්තකාලයේ භාවිතයට ගන්නා ලදී. මෙල්විල් කොසුත් ඩිවි (1851-1931) බේකනියානු ක්‍රමය තම පුස්තකාල වර්ගීකරණ පද්ධතියේ පදනම වශයෙන් භාවිත කරන ලදී. ලොව ජනප්‍රිය ඩිවි දශම වර්ගීකරණ පද්ධතිය නිර්මාණය වීම ඒ අනුව සිදු විය.

මුලින් පැවැති දාර්ශනික (දැනුම) වර්ගීකරණ පද්ධතිවල අරමුණ "වාර්තාගත දැනුම" සංවිධානය කිරීම නො වේ. පුස්තකාල වර්ගීකරණයක් වැදගත් වන්නේ වර්තාගත දැනුම රාක්කවල හෝ කිසියම් ස්ථානයක භෞතික වශයෙන් සංවිධානය කර තැබීම සඳහා ය. වර්තාගත තොරතුරු ගබඩා කිරීම, පෙළ ගැස්වීම, ආරක්ෂා කිරීම, සමුද්ධරණය ආදී ප්‍රායෝගික අවශ්‍යතා ඉටු කර ගැනීම පුස්තකාල වර්ගීකරණ පද්ධතියකින් බලාපොරොත්තු වන අරමුණු යි. ත්‍රිපිටකාගත වර්ගීකරණය දාර්ශනික වර්ගීකරණයක් ලෙස නො ව, දැනුම සංවිධානය කිරීමේ අරමුණින් ප්‍රායෝගික අවශ්‍යතා සඳහා යොදා



ගන්නා ලද වර්ගීකරණයක් ලෙස සලකා බැලිය හැකි ය. ත්‍රිපිටක වර්ගීකරණය දැනුම වර්ගීකරණයේ හා පුස්තකාල වර්ගීකරණයේ අතර මැද අවස්ථාවක පවතී.

බුද්ධ දේශනාව විභජ්ජවාදී දහමක් වූ හෙයින් දැනුම වර්ග කොට දැක්වීම කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කොට ඇත. වර්ගීකරණය බෞද්ධ ඥාන මාර්ගයකි. එබැවින් එහි දාර්ශනික ප්‍රවණතාවක් දක්නට ලැබේ. අභිධර්ම පිටකය තුළ මෙම විභජ්ජවාදී ප්‍රවණතාව කෙතරම් දුරට ක්‍රියාවට නංවා තිබේ ද යන්න පැහැදිලි වේ. විවිධ න්‍යායන් ඔස්සේ එක් එක් ධර්ම කරුණු බෙදා දැක් වූ ආකාරය අභිධර්ම පිටකය විමසීමෙන් පැහැදිලි කර ගත හැකි ය. එහෙත් ත්‍රිපිටක වර්ගීකරණය නිර්මාණය වන්නේ එවැනි දාර්ශනික අවශ්‍යතාවක් ඉටු කිරීම සඳහා නො වේ. එහි අරමුණු වී ඇත්තේ බුද්ධ දේශනාව සංවිධාන කිරීම, භාවිතයට ගැනීම, ආරක්ෂා කිරීම වැනි ප්‍රායෝගික අවශ්‍යතාවන් ඉටු කර ගැනීම යි. බුදු රදුන් පිරිනිවීමෙන් පසු උන්වහන්සේ ගේ දේශනා මතක තබා ගැනීමට, සිහි කැඳවීමට, ඉගෙන ගැනීමට පහසු වන ආකාරයෙන් ඒ සියල්ල සංවිධානය කිරීම අවශ්‍ය වී ය. එම තොරතුරු වාස්තවික වශයෙන් ආරක්ෂා කිරීමට හා සංවිධානය කිරීමට නිර්මාණය කර ගත් වර්ගීකරණ පද්ධතියක් වශයෙන් ත්‍රිපිටක වර්ගීකරණය හඳුන්වා දිය හැකි ය.

## 7. "ස්මෘතිගත වාර්තා"

මෙහි විශේෂත්වය වන්නේ ත්‍රිපිටක වර්ගීකරණය නිර්මාණය වන අවධියේ එකී දැනුම වර්තාගත සාහිත්‍යයක් වශයෙන් එවක නො පැවැතීම යි. ත්‍රිපිටකය ආරම්භයේ පටන් පැවැතියේ ස්මෘතිගතව පවත්වා ගැනීම සඳහා සුදුසු වන ලෙස සූත්‍ර යනුවෙන් දැනුම් ඒකක වශයෙන් බෙදා පිළියෙළ කර ගන්නා ලද වාක් සම්ප්‍රදායක් වශයෙනි. එය කඩදාසි, පුස්කොළ ආදී කිසියම් ලේඛන මාධ්‍යයක වාර්තාගත නො වී ය. සූත්‍ර කිසියම් මාධ්‍යයක

ලේඛනගත නො කළ ද වාර්තාමය ස්වභාවයක් දරනු ලැබිණි. ඒවා "ස්මෘතිගත වාර්තා" විශේෂයක් ලෙස සැලකිය හැකි ය. පුස්තකාල රාක්කවල පෙළ ගැස්වීමට නො ව එකී සූත්‍ර රාශිය මතකයේ තබා ගැනීමට, ඉගෙනීමට, ඉගැන්වීමට පහසු වන පරිදි සංවිධාන කිරීම සඳහා වර්ගීකරණය සම්පාදනය කර ගෙන ඇත. මෙම වාර්තා දැරුවෝ "භානකවරු" නම් වූහ. භානකවරුන් සතු වූ ස්මෘතිය නැමැති අවකාශයේ සූත්‍ර නමැති වාර්තා සංවිධානය කිරීමේ දී මෙම වර්ගීකරණය උපකාර වීය. ත්‍රිපිටකාගත වර්ගීකරණය හා නූතන පුස්තකාල වර්ගීකරණ ක්‍රම අතර කිසියම් සමානත්වයක් අපට පෙනෙන්නේ මේ වාර්තා ස්වරූපය සංවිධානය කිරීමක් සිදුව ඇති නිසා ය.

## 8. ප්‍රායෝගිකත්වය:

ත්‍රිපිටක වර්ගීකරණය සූත්‍ර නොහොත් ධර්ම කොටස් වර්ග කිරීම, සංවිධාන කිරීම, පෙළගැස්වීම ආදී ප්‍රායෝගික අවශ්‍යතා මත සාදා ගත් වර්ගීකරණයකි. මෙම වර්ගීකරණ ක්‍රමය නිසා උපයෝජකයාට එහි ඇතුළත් කිසියම් සූත්‍රයක් හෝ ධර්ම කොට්ඨාශයක් පහසුවෙන් හඳුනා ගැනීමට, තෝරා ගැනීමට හා සිහියේ තබා ගැනීමට පහසු විය. ඉතා විශාල සූත්‍ර හා ධර්ම කරුණු සංඛ්‍යාවක් පිටක, නිකාය, අංග, වග්ග, සංයුත්ත, නිපාත, ග්‍රන්ථ, බණවර ආදී වශයෙන් බෙදා දැක්වීම මේ අනුව සිදු විය. බුදුන් වහන්සේ ගේ සෑම සූත්‍රයකට ම, දේශනාවකට ම, ශික්ෂා පදයකට ම මෙම වර්ගීකරණ පද්ධතියේ නිශ්චිත ස්ථානයක් හිමි වී ඇත. ඒ නිසා අසුවල් පිටකයේ, අසුවල් නිකායේ, අසුවල් සංයුත්තයේ, අසුවල් වග්ගයේ ආදී වශයෙන් කිසියම් සූත්‍රයක් හඳුනා ගත හැකි වී තිබේ. සූත්‍රයක් තවත් සූත්‍රයකින් වෙන් කර හඳුනා ගැනීමට මෙම වර්ගීකරණය විශාල උපකාරකයකි. ත්‍රිපිටකය හුදු "බෙහෙත් වට්ටෝරුවක්" වැනි තත්ත්වයට පත් නො වී පර්යේෂණ මූලාශ්‍රයක් හෝ විමර්ශන සාහිත්‍යයක් බවට පත් වූයේ සංගීතිකාරකයන් වහන්සේලා සූත්‍ර ක්‍රමයක් සාදා ඒවා මැනවින් වර්ගීකරණය කළ බැවිනි.



කෙසේ වුවත් වර්තමාණයේ අප අතට පත් වී ඇති ත්‍රිපිටකාගත වර්ගීකරණයත් එය සකස් වෙමින් පැවැති පළමු හා තෙවන සංගායනා අතර කාලයේ පැවැති වර්ගීකරණයත් එකක් ම යැයි නිසැකව කිව හැකි ද යන්න ගැටලුවකි. වර්තමාන ත්‍රිපිටකාගත වර්ගීකරණය අතීත ත්‍රිපිටක වර්ගීකරණයේ විකාශනයක් ලෙස සැලකීම වඩා සුදුසු ය. තෙවන සංගායනාව වන විට ත්‍රිපිටකය සම්පූර්ණ වූයේ යැයි සලක ලද්දේ වුව ද ඉන් පසු කාලයේ ද ත්‍රිපිටකය තුළට යම් යම් ග්‍රන්ථ හෝ සූත්‍ර කොටස් අන්තර්ගත කොට ඇති බව පෙනේ. මෙසේ පශ්චාත් කාලීන ග්‍රන්ථ ද එතෙක් පැවැති ත්‍රිපිටක වර්ගීකරණයේ යම් යම් ස්ථානවලට අන්තර්ග්‍රහණය කිරීම සිදු විය. සූත්‍ර පොත් පත් වශයෙන් නො ව කටපාඩමේ පැවැති ග්‍රන්ථ විශේෂයක් නිසා සමහර විට ඒවා කලින් කල සංවිධාන කිරීමේ දී වෙනස්කම්වලට ලක් වන්නට ද ඇත. එවිට වර්ගීකරණය තුළ එම ධර්ම කොටස් කලින් තිබූ තැන්වලින් වෙනස් වී වෙනත් තැන්වලට මාරු වන්නට ද ඇත.

## 9. වර්ගීකරණ ක්‍රියාවලිය:

වර්ගීකරණ ක්‍රියාවලිය සිදු වන්නේ පදාර්ථවල සමාන ලක්ෂණ ඒකරාශී කිරීම හා අසමාන ලක්ෂණ බැහැර කිරීම මගිනි. වර්ගීකරණය සාර්ථක වන්නේ තර්කානුකූල ව බෙදා දැක්වීමෙනි. යමක් තර්කානුකූල ව බෙදනුයේ විභේදක (characteristics) යොදා ගැනීමෙනි. දේවල් තර්කානුකූල බෙදන මිනුම් දණ්ඩ විභේදක නම් වේ.[6]

විභේදකයක් යනු වර්ග පංතියක් උප පංතිවලට පැහැදිලිව බෙදා දැක්වීමට භාවිත කරන උප ලක්ෂණයක් හෝ ගුණාංගයකි.[7]

දේවල්වල සම-විසමතා පිළිබඳ අදහස ඇති වන්නේ විභේදක භාවිත කොට වෙන් කිරීම නිසා ය. දෙයක් තව දෙයකින් වෙන් කොට සලකා බැලීමට ඒ ඒ පදාර්ථ තුළ පවත්නා ගති ගුණ මූලික වේ. සමාන ගතිගුණ ඇති පදාර්ථ එක් පංතියක් ලෙස දැක්වීමත්

ඊට අසමාන ගති ඇති පදාර්ථ ඉන් බැහැර කිරීමත් වර්ගීකරණයේ මූලික ලක්ෂණයකි. මෙවැනි විභේදකයක තිබිය යුතු වැදගත් අවශ්‍යතාව වන්නේ අදාළත්වය යි. එනම් කිසියම් විභේදයක් අප භාවිත කරන්නේ නම් එය වර්ගීකරණ පද්ධතියේ අරමුණට ගැළපෙන එකක් විය යුතු ය. අරමුණට අදාළ විභේදය භාවිත කිරීමෙන් වර්ගීකරණය සාර්ථක භාවයට පත් වේ.

## 10. විභේදකඃ

සංගීතිකාරකයන් වහන්සේලා බුද්ධ දේශනාව වර්ග කිරීමේ දී කුමන විභේදක භාවිත කරන ලද්දේ ද යන්න අපට හඳුනා ගත හැක්කේ අප අත අද තිබෙන්නා වූ ත්‍රිපිටකය විමසා බැලීමෙනි. මෙම විභේදකවලින් සමහර ඒවා පැහැදිලි අතර සමහර ඒවා අපැහැදිලි ය. ත්‍රිපිටක වර්ගීකරණය සඳහා පැහැදිලිව තෝරා ගත් ගති ලක්ෂණ මුල දී යොදා ගන්නට ඇත. එහෙත් පසු කාලීනව අන්තර්ගතයේ සිදුව ඇති ඉහත කී වෙනස්කම් නිසා මෙම වර්ගීකරණයේ ව්‍යාකූලතා සිදුව ඇති බව පෙනේ. මේ නිසා වර්තමානයේ දී ත්‍රිපිටක වර්ගීකරණ තුළ භාවිත කරන ලද විභේදක හඳුනා ගැනීමේ දුස්කරතා පවතී.

කෙසේ වුවත් මෙම වර්ගීකරණයේ දී සුදුසු හා පැහැදිලි විභේදක භාවිත කොට ඇති අවස්ථා තැන තැන හඳුනා ගත හැකි ය. නිදසුනක් ලෙස "ත්‍රිපිටක" යනුවෙන් බුද්ධ වචනය වර්ග පංති තුනකට බෙදන ලද්දේ මක්නිසා ද යන්න අටුවාචාර්වරු දැක්වූහ. "පිටක" යන යෙදුමෙන් යම්කිසි බඳුනක් හෝ කූඩයක් හෝ අදහස් වේ. ඒ අනුව පර්යාප්ති ධර්මය කොටස් වශයෙන් වෙන් වෙන් ව අසුරා තබන ලද "භාජන" යනුවෙන් පිටක යන්න අර්ථ දැක්විය හැක.[8]

සමස්ත බුද්ධ දේශනාව ඇතුළත් මෙවැනි පිටක තුනකි. එසේ වීමට හේතුව ත්‍රිවිධාකාර වූ භේදය යැයි අටුවා ඇදුරෝ කියති. දේශනා භේදය, ශාසන භේදය, කථා භේදය යනාදී නයින් අටුවා ඇදුරෝ බුද්ධ වචනය ප්‍රවර්ග කරති. දේශනා භේදය අනුව බුද්ධ



වචනය තෙවැදෑරුම් ය. ඒ ආඥාදේශනා, වොහාරදේශනා, පරමත්ථදේශනා යනුවෙනි. ශාසන භේදය අනුව ද එය තෙවැදෑරුම් ය. ඒ යථාපරාධසාසන, යථානුලොමසාසන, යථාධම්මසාසන වශයෙනි. කථා භේදය අනුව ද සංවරාසංවරකථා, දිට්ඨිනිවෙඨනකථා, නාමරූපපරිච්ඡේදකථා වශයෙන් ත්‍රිවිධ වේ. එසේ ම ශික්ෂා වශයෙන් ද පිටකය කොටස් තුනකට ගළපනු ලැබේ. ඒ අධිශීල අධිචිත්ත, අධිපඤ්ඤා යනුවෙනි.

## 11. ප්‍රධාන වර්ග පංතිඃ

මේ ත්‍රිවිධ බෙදුම්වලින් දැක්වෙන්නේ පිළිවෙළින් විනය, සූත්‍ර, අභිධර්ම යන පිටක තුනට අයත් ධර්ම ය යි. ත්‍රිපිටක වර්ගීකරණයේ පළමු බෙදුම් පියවර මෙය යි. වර්ගීකරණයක ප්‍රධාන බෙදුම් සංඛ්‍යාව තීරණය කිරීම වැදගත් අවස්ථාවකි. බෞද්ධ වර්ගීකරණ සම්ප්‍රදාය අනුව බුද්ධ වචනය මුල දී ධම්ම හා විනය වශයෙන් ද්වි භේද වශයෙන් පැවැතිණි. අභිධර්මය සංවර්ධනය වීමෙන් තෙවන පිටකයක් සම්පාදනය වී ය. ඒ අනුව බුද්ධ දේශනාව පළමු මට්ටමේ දී ප්‍රධාන වර්ග පංති තුනකට බෙදා දක්වන ලදී. වර්ග පංති තුනක් අනුව වර්ගීකරණය කිරීම කෙරෙහි දක්වා ඇති උනන්දුව ත්‍රිපිටකයේ නොයෙක් තැන පැහැදිව දක්නට ලැබේ.

වර්ගීකරණ පද්ධතියේ වර්ග පංති නම් කිරීමේ දී අන්තර්ගතය පැහැදිලි වන ආකාරයෙන් සිදු කිරීම වැදගත් ය. ඒ අනුව එක් එක් පිටකය වෙන් වෙන් වශයෙන් නාමකරණය කරනු ලැබ ඇත්තේ ඒවායේ ගති ලක්ෂණ නිරූපණ කෙරෙන පරිදි ය. විනයට විනය යැයි හඳුන්වන ලද්දේ මක්නිසා ද? විශේෂිත න්‍යායන් අනුව (විභංග වශයෙන්) ශික්ෂා පද බෙදා ඇති නිසා ද පැවිද්දන්ගේ කය වචන හික්මවන නීති රීති නිසා ද විනය වාදීන් විසින් විනය යැයි වෙන් කොට හඳුන්වන නිසා ද විනය පිටකයට ඒ නම තබා ඇති බව අටුවා ඇදුරෝ පවසති.

සූත්‍ර යනු හුය යන්නයි. වඩුවන්ට නූල ප්‍රමාණ වේ. අරුත් වගුරන බැවින් ද සූත්‍ර නම් වේ. එසේ ම නූලෙන් ගොතන ලද මල් නො විසිරේ. බුද්ධිමතුන්ට සූත්‍ර ද එබඳු ය. සූත්‍ර පිටකයට අයත් වූයේ මෙකී ලක්‍ෂණ සහිතව ලෞකික ව්‍යවහාරයෙන් දේශනා කරන ලද ඉගැන්වීම් සම්භාරය යි.

අධිකව කියූ බැවින් අභිධර්ම නම් වන බව අටුවා මතය යි. පුද්ගල, ප්‍රදේශ, කාල වශයෙන් දේශනාවේ ඇති ලෝක ව්‍යවහාරය බැහැර කොට පරමාර්ථ ධර්මයන් විස්තර කිරීම අභිධර්ම පිටකයේ ලක්‍ෂණය යි. මෙලෙස මුල් බුදු සමයේ අධ්‍යයන ධාරාවන් හෙවත් ශික්‍ෂණයන් (disciplines) තුනක් ත්‍රිපිටකය තුළ නිරූපනය වන බව පැහැදිලිව දක්නට ලැබේ. මේ ශික්‍ෂණ වර්ගීකරණය අනුව එක් භික්‍ෂු කණ්ඩායම් එක් විශේෂිත පිටකයක් පිලිබඳ විශේෂඥ භාවය ලබා ගත් බව ද පෙනේ. ධර්මධර, විනධර, ආභිධම්මික වැනි නම් වලින් ප්‍රසිද්ධ වූයේ එවැනි අධ්‍යයන ධාරාවන් තුළ විශිෂ්ටත්වයට පත් වූවෝ වෙති.

## 12. දැනුමේ ත්‍රිත්ව සංකල්පය:

දැනුමේ ඉතිහාසය විසීමේ දී එය ශික්‍ෂණයන් තුනකට බෙදා දැක්වීමේ විශ්ව සම්ප්‍රදායක් අතීතයේ පැවැති බව පෙනේ. අතීතයේ පැවැති වෙනත් දැනුම වර්ගීකරණ සම්ප්‍රදායන් දෙස බැලීමේ දී ද දැනුම් විශ්වය මූලික වශයෙන් කොටස් තුනකට බෙදා දක්වා ඇති බව පෙනේ. බ්‍රාහ්මණ සම්ප්‍රදායේ දැනුම ඍග්, යජුර් හා සාම වශයෙන් කොටස් තුනකට බෙදා ත්‍රිවේද වශයෙන් හඳුන්වා දී ඇත.

බටහිර දැනුම වර්ගීකරණ පද්ධතිවල ප්‍රධාන වර්ග පංති තුනක් හඳුනා ගත හැකි ය. ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල්ගේ (ක්‍රි.පූ. 384-322) දැනුම වර්ගීකරණ සැලැස්මේ පදනම දැනුම මූලික කොටස් තුනකට බෙදීම යි. ඔහු එය 1. න්‍යායික දැනුම (දැනුම වෙනුවෙන් වූ දැනුම) 2. නිෂ්පාදන දැනුම (යමක් නිෂ්පාදනයට හෝ සෞන්දර්යයට හේතු වන දැනුම) 3. ප්‍රායෝගික දැනුම



(අර්ථශාස්ත්‍රය, ආචාරධර්ම, දේශපාලනය) වශයෙන් වර්ග කළේ ය.

ප්‍රැන්සිස් බේකන් විසින් (1561-1626) සිය Advancement of lerning නමැති කෘතියේ දෙවැනි කොටසේ එම සාම්ප්‍රදායික බෙදීම බැහැර කොට නව ප්‍රවර්ග තුනක් හඳුන්වා දෙන ලදී. ඒ 1. ඉතිහාසය හෙවත් මිනිසාගේ මතකයට සම්බන්ධ දැනුම, 2. කාව්‍ය හෙවත් මිනිසාගේ පරිකල්පනයට අදාළ දැනුම හා 3. දර්ශනය හෙවත් මිනිසාගේ තර්ක ඥානය යනුවෙනි. එසේ ම ඔහු විසින් එම ශික්‍ෂණ ධාරා තුන පිළිවෙළින් දිව්‍යමය, මානවීය හා ස්වභාවික යන ප්‍රපංචවලට අදාළ අවබෝධය ලෙස පැහැදිලි කරන ලදී.

මෙල්විල් ඩිවි විසින් විශ්ව දැනුම වර්ග පංති 10කට බෙදා දශම වර්ගීකරණය නිර්මාණය කරන ලද්දේ ප්‍රැන්සිස් බේකන් ගේ මේ ත්‍රිවිධ බෙදීම පදනම් කොට ගෙන යි. ඩිවි දශම වර්ගීකරණයේ 100-600 වර්ග පන්ති මිනිසාගේ තර්කනය හෝ විද්‍යාවට අයත් විෂයන්ට ද 700-800 වර්ග පන්ති පරිකල්පනයට අයත් සාහිත්‍ය, කලා ආදී විෂයන්ට ද 900 වර්ගපන්තිය සිදුවීම් හා තත්වයන් පිළිබඳ වාර්තාවලට එනම් ඉතිහාසයට ද බෙදා දැක්විය හැකි ය.[9]

බුදුන් වහන්සේ ස්වකීය ඥාන සම්භාරය ධම්ම-විනය යනුවෙන් ද්විභේද කොට හඳුන්වා දෙන ලද්දේ සමස්ත දැනුම් විශ්වය ම ආවරණය වන පරිදි ය. උන්වහන්සේ යමක් පිළිබඳ දේශනා කළා ද, සාකච්ඡා කළා ද, සිතනු ලැබුවා ද, උපකල්පනය කළා ද ඒ සියල්ල ධර්මයෙන් හෝ විනයෙන් බැහැර නො වේ. බුද්ධ දේශනාවට අනුව මේ දෙකින් බැහැර දැනුමක් පැවැතිය නො හැකි ය. බුද්ධඝෝෂාදී ආචාර්යවරුන් විසින් රචිත අටුවා වර්තමාණයේ ත්‍රිපිටකයෙන් බැහැර කොට තබනු ලැබුව ද අතීතයේ පාලි අටුවා ත්‍රිපිටකයේ ම කොටස් වශයෙන් පැවැති බව පෙනේ. මේවා වර්තමාණයේ ත්‍රිපිටක ග්‍රන්ථ ලෙස හඳුන්වනු නො ලැබුව ද යම් හෙයකින් ඒවා පෙළ තුළට ම ඇතුළත් කරන

ලද්දේ නම් තත්ත්වය වෙනස් වන්නට තිබිණි. කෙසේ වුවත් අටුවා, ටීකා ඈදී සියලු ම පශ්චාත් කාලීන ලේඛන ත්‍රිපිටක ග්‍රන්ථවලින් වෙන් කොට සලකා ඇත. ථෙරවාදී සම්ප්‍රදාය තුළ අටුවා ආදී අර්ථකථන සම්ප්‍රදාය වෙන් ව තැබීමෙන් බුද්ධ දේශනාව ලෙස සලකන ලද ත්‍රිපිටකයේ නිර්මලත්වය ආරක්‍ෂා කිරීමට ප්‍රයත්න දැරුවා විය යුතු ය. එහෙත් ත්‍රිපිටක වර්ගීකරණයට සමාන්තර ව එකී අටුවා ග්‍රන්ථවල ද තොරතුරු සංවිධානය කරන ලදී.

බුද්ධ වචන, ධම්ම-විනය, ත්‍රිපිටක, සාසන, ප්‍රවචන ආදී විවිධ නම්වලින් හඳුන්වනු ලැබුව ද මෙයට අයත් වූයේ බුදුන් වහන්සේ ගේ ඉගැන්වීම් හා තදනුබද්ධ දැනුම් සම්භාරය යි. නවංග ශාස්තෘ ශාසනය වශයෙන් ඉපැරණි වර්ගීකරණයක් පිළිබඳ අටුවාවල දැක්වා ඇත. එක් එක් අංගයට ඇතුළත් වන සූත්‍ර මොනවාද යන්න පිළිබඳ නිදසුන් ද දක්වා ඇත. බුද්ධ දේශනාව සංවිධානය කිරීමට වඩා විශ්ලේෂණය කිරීමට මෙම නවංග ක්‍රමය භාවිත වූවා විය හැකි ය.

### 13. බෙදුම් ‘ක්‍රම- නිකාය:

සූත්‍ර පිටකයේ ප්‍රධාන බෙදුම් ක්‍රමය වන්නේ "නිකාය" ක්‍රමය යි. නිකාය යන්නෙහි අරුත නිවාසය යනු යි. සූත්‍ර සමූහ වශයෙන් නිවසන බැවින් නිකාය නම් වේ. සූත්‍රවල දිග ප්‍රමාණය හා වෙනත් ලක්‍ෂණ සලකා අනුව ඒවා නිකායන් පහකට බෙදා දක්වා ඇත.[10]

සූත්‍රවල දිග ප්‍රමාණය සූත්‍ර වර්ග කිරීමේ දී භාවිත කරන ලද පැහැදිලි විභේදකයකි. දීර්ඝ භාවය පිළිබඳ සංකල්පය විෂයේ අන්තර්ගතය හඳුනා ගත හැකි විෂය පදයක් නො ව සූත්‍රයේ භෞතික ලක්‍ෂණයක් ප්‍රකාශ කරන්නකි. එය පොත් පත් ඒවායේ විශාලත්වය අනුව වර්ග කිරීමක් වැනි ය. මෙහි දී දිග භාවය අනුව සූත්‍ර වර්ග කිරීමේ වැදගත්කමක් තිබේ. සූත්‍ර කටපාඩමේ පැවැති බැවින් ඒවා සජ්ඣායනය කිරීමට ගත වන කාලය



භානකවරුන්ට වැදගත් විය. මේ අනුව ප්‍රමාණයෙන් දීර්ඝ හෙවත් සජ්ඣායනයට වැඩි කාලයක් ගන්නා සූත්‍ර "දීඝ නිකාය" වශයෙන් වර්ග කරන ලදී. මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර එකතුව "මජ්ඣිම නිකාය" වශයෙන් බෙදන ලදී. එසේ නම් කුඩා ප්‍රමාණයේ සූත්‍ර වර්ගයට කුමක් වී ද? වර්තමාන කුද්දක නිකායේ ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් අන්තර්ගත වේ. එහෙත් එය කුඩා ප්‍රමාණයේ සූත්‍ර, ගාථා ආදිය ඇතුළත් ධර්ම ග්‍රන්ථවල එකතුවකි. එහි ඇතුළත් කුද්දකපාඨ, ජාතක, ධම්මපද ආදී කුඩා ධර්ම සංග්‍රහ නිදසුන් වේ. සූත්‍රවල දිග ප්‍රමාණය සලකා ඒවා දීර්ඝ භාවයෙන් වැඩි, මධ්‍යම හා කුඩා වශයෙන් කොටස් තුනකට තර්කානුකූලව බෙදා දැක්විය හැකි ය. මේ හැර සංයුත්ත හා අංගුත්තර යැයි තවත් නිකාය දෙකක් සූත්‍ර පිටකයට අතුළත් ය.

### 14. මිශ්‍ර වර්ගය:

සංයුත්ත නිකාය මිශ්‍ර සූත්‍ර එකතුවකි. සෑම පුස්තකාල වර්ගීකරණ පද්ධතියක ම පාහේ මිශ්‍ර වර්ගය, වෙනත් වර්ගය (other class), හෝ පොදු වර්ගය (generalia class) යනුවෙන් හඳුන්වා ඇති වර්ග පංතියක් දක්නට ලැබේ. කිසියම් ආකාරයකින් වෙනත් විෂයන්ට ද සම්බන්ධ හෝ කිසියම් නියත විෂයකට සෘජුවට අන්තර්ගත කළ නො හැකි හෝ ප්‍රලේඛන මිශ්‍ර වර්ග පංතියේ ඇතුළත් කර ඇති බව පෙනේ. නිදසුනක් ලෙස පුවත් පත් දැක්විය හැකි ය. පුවත්පතක සමාජ, දේශපාලන, ආගමික, ආර්ථික, විනෝදාශ්වාදය ආදී විවිධ තොරතුරු ඇතුළත් වේ. මිශ්‍ර භාවය වර්ගීකරණ විරෝධි තත්ත්වයක් වුව ද එය ඉක්මවීමට කිසි ම වර්ගීකරණ පද්ධතියකට හැකි වී නොමැත. එසේ නම් දීර්ග, මධ්‍යම හා කුඩා වශයෙන් සලකා බැලිය නො හැකි හෝ ඒ සියල්ලටම අයිති හෝ මිශ්‍ර සූත්‍ර සංයුත්ත නිකායේ ඇතුළත් විය යුතු ය. එකකට එකක් සම්බන්ධ (connected) බවක් ද එයින් පැවසේ. සංයුත්ත නිකායේ සූත්‍ර වර්ග ගත් කල්හී මේ මිශ්‍ර භාවය වඩා පැහැදිලි වේ. එහි රජ,

බ්‍රාහ්මණ, ගෘහපති, භික්ෂු, භික්ෂුණී, දේව, මාර ආදී විවිධ පුද්ගලයන්ට බුදුන් වහන්සේ දේශනා කළ සූත්‍ර අන්තර්ගත වී ඇත.

### 15. "අංගුත්තර" ක්‍රමය:

දේශනාවල අඩංගු ධර්ම කරුණුවල සංඛ්‍යා ලක්ෂණ අනුව එක, දෙක, තුන ආදී වශයෙන් ගණනය කොට ඒ අනුව එක් එක් සංඛ්‍යාවට වැටෙන සූත්‍ර නිපාත වශයෙන් බෙදා දැක්වීම අංගුත්තර නිකායේ වර්ගීකරණයේ ලක්ෂණය වී තිබේ. ඒ අනුව එක ධර්ම කරුණක් ඉගැන්වෙන සූත්‍ර එක නිපාතයේ ද ධර්මකරුණු දෙකක් ඉගැන්වෙන සූත්‍ර දුක නිපාතයේ ද ආදී වශයෙන් බෙදා දැක්වේ. මේ සංඛ්‍යාත්මක පරිගණනය (enumeration) භාවිත කොට සූත්‍ර වර්ග කොට ඇති අවස්ථාවක් වැනි ය. තැන් තැන්වලින් උපුටා ගන්නා ලද ධර්ම කොට්ඨාශ ඒවායේ සංඛ්‍යා ලක්ෂණ අනුව එක, දෙක, තුන ආදී වශයෙන් එකක් අනෙකට අධික වන ආකාරයෙන් අනු පිළිවෙලින් තැබීම අංගුත්තර ක්‍රමය යි.[11]

දීඝ නිකායේ සංගීති සූත්‍රය හා දසුත්තර සූත්‍රය තුළ දක්නට ලැබෙන්නේ ද මෙම අංගුත්තරනිකායේ ධර්ම සංග්‍රහ කළ පිළිවෙළ යි.[12] එය සැරියුත් තෙරුන් ගේ ධර්ම සංගායනාවක් ලෙස හඳුන්වා ඇත. එසේ නම් පැරණි සංගායනා ක්‍රමය අනුව සංවිධානය කළ එක ම නිකාය ග්‍රන්ථය අංගුත්තර නිකාය පමණක් ද යන ගැටලුව මතු වේ. කෙසේ වුවත් ධර්මය සංගායනා කිරීම යනු එක්තරා ආකාරයකින් ධර්මය වර්ග කිරීමක්, විභාග කිරීමක් විය යුතු බව මුල් කාලයේ පටන් පිළිගෙන ඇති බව මෙයින් පෙනේ.

### 16. පුද්ගලභාව භේදක:

නිකාය ග්‍රන්ථවල සූත්‍ර වර්ග කිරීමේ දී පණ්ණාසක, නිපාත, වග්ග, සංයුත්ත ආදී තවත් භේදක කිහිපයක් භාවිත කොට ඇත.



ත්‍රිපිටක වර්ගීකරණයේ භාවිත කොට ඇති මේ පදවලින් ඒවායේ අන්තර්ගත ධර්මය බෙදා දැක්වීමට පදනම් වූ ගති ලක්ෂණ ප්‍රකාශ වන්නේ නැත. ඒවා බොහෝ විට වර්ග පංති හැඳින් වීම සඳහා යොදා ගන්නා ලද පද විශේෂයකි. මේ නිසා වර්ගීකරණයේ භාවිත කරන ලද විභේදක විමසා බැලි යුත්තේ එක් එක් වර්ගවලට අයත් සූත්‍ර රාශියේ ගති ලක්ෂණ විමසා බැලීමෙනි. එසේත් නැතිනම් එම පද සමග යෙදෙන විශේෂණ පද ඇසුරිනි. නිදසුනක් ලෙස කෝසල සංයුත්තය යනු කොසොල් රජු සම්බන්ධ සූත්‍ර දේශනා ඇතුළත් වර්ග පංතියකි. දේවතා සංයුත්තයේ දෙවියන් සම්බන්ධ සූත්‍ර දේශනා ඇතුළත් වේ. දේවතා, දේවපුත්ත, කෝසල, මාර, භික්ඛුණී, බ්‍රහ්ම, බ්‍රාහ්මණ, වංගීස, වන, යක්ඛ හා සක්ක ආදී වශයෙන් පුද්ගල භාවය භේදක ලක්ෂණය වශයෙන් සලකා සිදු කරන ලද වර්ගීකරණයක් මෙහි දී දැකිය හැක.

### 17. පණ්ණාසක:

මජ්ඣිම නිකායේ කොටස් බෙදා දැක්වීම සඳහා පණ්ණාසක ක්‍රමය භාවිත කෙරේ. එහි සූත්‍ර 50 බැගින් කොටස් තුනකට බෙදා දැක්වා ඇත. ඒවා මූල පණ්ණාසක, මජ්ඣිම පණ්ණාසක හා උපරි පණ්ණාසක වශයෙන් නම් කොට ඇත. මූල, මජ්ඣිම හා උපරි වශයෙන් කරනු ලබන බෙදීම වෙනත් තැන්වල ද දක්නට ලැබෙන ක්‍රමයකි. කිසිවක් පරිපූර්ණ වශයෙන් අවස්ථා තුනකට (මුල, මැද හා අග වශයෙන්) පමණක් බෙදා දැක්වීමට අවශ්‍ය වූ විට මේ ත්‍රිත්වය භාවිත කිරීම සුදුසු විය. එබැවින් සූත්‍ර එකසිය පනස් දෙකක් සහිත මජ්ඣිම නිකාය කොටස් තුනකට බෙදා එක එකක් මූල, මජ්ඣිම හා උපරි වශයෙන් ඒවා නම් කළේ ය. වර්ගයක සූත්‍ර පනහක් වූ බැවින් පණ්ණාසක නම් විය. එහෙත් ඊට වඩා අධික සූත්‍ර ප්‍රමාණයක් පණ්ණාසක වශයෙන් බෙදීමට ඇති විට එක් එක් පණ්ණාසකය පිළිවෙළින් එක, දෙක, තුන, හතර ආදී වශයෙන් නම් කරන ලදී. සළායතන සංයුත්තයේ

පඨම පණ්ණාසක, දුතිය පණ්ණාසක ආදී වශයෙන් වර්ග පංති නම් කොට ඇත්තේ එහි පනහේ කොටස් වලට වර්ග කිරීමට විශාල සූත්‍ර ප්‍රමාණයක් තිබුණු නිසා ය. මීට අමතර ව අංගුත්තර නිකායේ නොයෙක් නිපාතවල ද පණ්ණාසක වර්ග දක්නට ලැබේ.

18. නිපාතඃ

නිපාත යනු අංගුත්තර නිකායේ ප්‍රමුඛ බෙදීම කි. නිපාත යනු වැටීම හෙවත් හෙළීම යි. නිපාත පුළුල් වර්ග පංතියකි. නිපාතයකට විශාල සූත්‍ර සංඛ්‍යාවක් ඇතුළත් විය හැකි ය. එබැවින් එය වග්ග වශයෙන් හෝ පණ්ණාසක වශයෙන් හෝ ඊළඟ පියවරේ දී වර්ග කරනු ලැබේ. නිපාත යන පදයෙන් අර්ථවත් වන පරිදි එහි දී වර්ග කරනු ලබන්නේ වෙනත් තැන්වලින් ධර්ම කරුණු, සූත්‍ර උපුටා ගෙන ඒවා ක්‍රමාණුකූලව නිපතනය කිරීමෙනි. එක, දෙක, තුන ආදී සංඛ්‍යාත්මක ව නිපාත නම් කිරීම අංගුත්තර නිකායේ දක්නට ලැබේ. මීට අමතරව ඉතිවුත්තක, ථෙරගාථා, ථෙරිගාථා, ජාතක වැනි කෘතිවල නිපාත අනුව කරන ලද බෙදීම් දක්නට ලැබේ. ඒවායේ ද නිපාත එක, දුක, තික ආදි වශයෙන් නම් කිරීම සාමාන්‍ය පිළිවෙළ යි. එහෙත් අංගුත්තර නිකායේ නිපාත නම් කිරීමෙහිත් මෙකී පොත්වල නිකාය නම් කිරීමෙත් වෙනසක් ඇත.

අංගුත්තර නිකායේ එක, දුක, තික ආදී වශයෙන් නිපාත නම් කිරීමට හේතුව ඒ ඒ නිපාතයන්හි අන්තර්ගත සූත්‍රවල ධර්ම කරුණු සංඛ්‍යාව සැලකිල්ලට ගැනීම යි. එහෙත් අනෙක් කී කෘතිවල ඒක නිපාත, දුක නිපාත ආදී නය යොදා ගෙන ඇත්තේ වර්ග පංතිවල අනුපිළිවෙළ දැක්වීම සඳහා ය.

19. වග්ගඃ

වර්ගය යන අරුත දෙන "වග්ග" යන්න ත්‍රිපිටකයේ බහුලව පෙනෙන බෙදුම් ක්‍රමයකි. සාමාන්‍යයෙන් ත්‍රිපිටක වර්ගීකරණයේ



බොහෝ තැන්වල දහයේ කොටස් හැඳින්වීම සඳහා "වග්ග" යන පදය යොදනු ලැබේ. එහෙත් මෙම වග්ගවල සූත්‍ර සංඛ්‍යාවේ අඩු වැඩි වීම් ඇත. නිදසුනක් ලෙස සංයුත්ත නිකායේ ප්‍රධාන වග්ග පහක් ඇති අතර ඒවායේ සංයුත්ත නම් ලද වර්ගපංති 9ත් 13 අතර සංඛ්‍යාවක් ඇතුළත් වේ. දීඝ නිකායේ සූත්‍ර 34 බෙදා ඇත්තේ වග්ග තුනකට යි. ඒ සූත්‍ර 13ක්, 10ක් හා 11ක් ඇතුළත් වන පරිදි ය. වග්ගයක් නිතර ම පාහේ විශේෂණ පදයක් සමගින් නම් කරනු ලැබේ. ඒ මහා වග්ග, අප්පමාද වග්ග ආදී වශයෙනි. වග්ග අනුව සූත්‍ර කාණ්ඩ කිරීමේ දී සූත්‍රවල භේදක ලක්ෂණ සලකා ඇති අතර ඒ වග්ග නාමයෙන් වර්ග පංතියේ අන්තර්ගතය පිළිබඳ කිසියම් අදහසක් ඇති කර ගත හැකි ය.

පුද්ගල නාම, විෂය නාම හා චුල්ල, මහා, යමක වැනි යෙදුම්, වග්ග නම් කිරීම සඳහා යොදා ගෙන ඇත. නිදසුනක් ලෙස භික්ෂූන් ගේ නම් සඳහන් සූත්‍ර "භික්ඛු වග්ග" වශයෙන් දක්වනු ලැබේ. පරිබ්බාජක, ගහපති, රාජ, බ්‍රාහ්මණ ආදී පුද්ගල නාම සූත්‍ර වර්ග කිරීම සඳහා භාවිත කොට ඇත. මීට අමතරව ඔපම්ම (උපමා), යමක (යුගල සූත්‍ර) ඔවාද (අවවාද) ආදී විෂය නාම අනුව ද වර්ග නම් කොට තිබේ. කිසියම් වර්ගයක් එක ම නාමයකින් දැක් වීමට සිදු වූ අවස්ථාවක දී පළමු වැන්න මහා යනුවෙන් ද දෙවැන්න චුල්ල යනුවෙන් ද විශේෂ කරනු ලැබේ. එවිට ඒවා "මහා යමක වග්ග" හා "චුල්ල යමක වග්ග" යනාදී වශයෙන් දැක්වේ. එක ම නමින් වග්ග කිහිපයක් ඇති විට එම වග්ගයන් එක, දෙක ආදී වශයෙන් වෙන් කොට "පඨම අනිච්ච වග්ග" හා "දුතිය අනිච්ච වග්ග" ආදී නයින් දක්වනු ලැබේ.

20. දැනුම සිතියම්ගත කිරීමඃ

ත්‍රිපිටකයේ ඕනෑම බුද්ධ දේශනාවක් ම අපට හමු වන්නේ සූත්‍රයක් වශයෙනි. එහෙත් සූත්‍රය කරා ළඟා වීමට සූත්‍ර සම්භාරය වර්ගීකරණය කොට ඇති ආකාරය දැන සිටිය යුතු වේ. වර්ගීකරණය යනු දැනුම සිතියම්ගත කිරීමකි (mapping of knowledge). සූත්‍රයකට කිසියම් ස්ථානයක් ත්‍රිපිටක සිතියමේ

සලකුණු කොට තිබේ. ත්‍රිපිටකාගත වර්ගීකරණයේ ලක්‍ෂණයක් වන්නේ අවසන් දැනුම් ඒකකය (සූත්‍රය) දක්වා කිසියම් විභේදයකයක් පදනම් කර ගෙන බෙදීම සිදු කර තිබීම යි (hierarchical chain). මෙහි දැක්වෙන බෙදීම ක්‍රම භාවිත කිරීම නිසා ත්‍රිපිටක වර්ගීකරණයේ වර්ග පංතිවල ධූරාවලිය නිර්මාණය වී තිබේ. පුලුල් වර්ග පංතියේ සිට පටු වර්ග පංතිය දක්වා අනුක්‍රමයෙන් බෙදී යාම වර්ගීකරණයේ දී සිදුවේ. වර්ගීකරණ පද්ධතියක ප්‍රධාන වර්ග පංතිය (Main Class) පුළුල් වර්ග පංතිය වේ. පිටක යනු ප්‍රධාන වර්ග පංතිය යි. වග්ග යනුවෙන් නම් කළ කොටස් බොහෝ විට වර්ග පංති දාමයේ කෙලවර ඇති පටු වර්ග පංති වේ.

21. ප්‍රධාන වර්ගපංතිවල අනු පිළිවෙළ:

වර්ග පංතිවල අනුක්‍රමික භාවයට වර්ගීකරණ පද්ධතියේ වැදගත් ස්ථානයක් හිමි වේ. ප්‍රධාන වර්ග පංතිවල පිළිවෙළ සුවිශේෂ වේ. ප්‍රධාන වර්ග පංතිවල බෙදුම් ගණන එක් එක් වර්ගීකරණ පද්ධතිවල වෙනස් වේ. ඩිවි දශම වර්ගීකරණයේ ප්‍රධාන වර්ග පංති 10 කි.[13]

එම ප්‍රධාන වර්ග තීරණය කරනු ලැබ ඇත්තේ ඩිවි දශම වර්ගීකරණ පද්ධතිය බිහි වූ දහ නව වැනි සියවසේ අවසන් කාර්තුවේ ඇමරිකා එක්සත් ජනපදයේ විශ්වවිද්‍යාලවල ඉගැන්වූ ප්‍රධාන ශික්‍ෂණ දහයට අනුරූපව යි.[14] වර්ගීකරණ පද්ධති බිහි වූ සමාජීය තත්ත්වයන් මීට බලපා ඇත. ප්‍රධාන වර්ග පංතිවල අනුපිළිවෙළ කෙසේ සකස් වී තිබේ ද යන්න වර්ගීකරණය පද්ධතියක් විමසා බැලීමේ දී නැඟෙන තවත් ප්‍රශ්නයකි.

පිටකත්‍රය පෙළගැස්මේ දී කුමන සාධකයක් මූලික වී ද යන්න වැදගත් ය. පිටකත්‍රයේ අනුක්‍රමයෙන් ඓතිහාසික සංවර්ධනය නිරූපණය කරන ලද්දේ ද නැතිනම් වෙනත් අදහසක් මත කෙරේ ද යන්න සාකච්ඡා කළ හැකි ය. බුදුන් වහන්සේගේ සූත්‍ර දේශනා ඒවා දේශනා කළ කාලය අනුව සැලකීමේ දී විනය



පිටකයට වඩා ධර්මය හෙවත් සූත්‍ර පිටකය පැරණි යැයි සැලකිය හැකි ය. පැරණි යුගයේ දී ධම්ම-විනය (විනය-ධම්ම නො වේ) වශයෙන් බුද්ධ දේශනාව යෙදී තිබේ. අභිධර්මය ඒ දෙකට ම පසුව වර්ධනය වූ විෂයකි. මුල් අවධියේ දී විනය ශික්‍ෂා පද ධර්මයේ අන්තර්ගත ව පැවැති බව පැහැදිලිව පෙනෙන්නට තිබියදීත් ථෙරවාදීහු ධර්මය විනයේ අන්තර්ගත වන්නේ යැයි කීහ. මේ නිසා සාම්ප්‍රදායික අටුවා මතය අනුව ත්‍රිපිටකයේ පෙළ ගැස්ම විනය, සූත්‍ර, අභිධර්ම වශයෙන් තබනු ලැබේ. අට්ඨකථාවල දී ත්‍රිපිටකය හඳුන්වා දෙන සෑම විට ම විනය පිටකය පළමුවත් සූත්‍ර පිටකය දෙවනුවත් අභිධර්ම පිටකය තෙවනුවත් පිහිටන ලෙස පෙළ ගස්වා ඇත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව ද මේ පිළිවෙළ අනුගමනය කොට ඇත.

එහෙත් සාමාන්‍ය ව්‍යවහාරයේ දී විනය පිටකයට නො ව සූත්‍ර පිටකයට පළමු තැන හිමි වන බව පෙනේ. නිකායාන්තරිකයන් ගේ ත්‍රිපිටක පිළිවෙළෙහි ද මුලින් දැක්වෙන්නේ සූත්‍ර පිටකය යි. දුල්වා නම් ටිබැට් විනය ග්‍රන්ථයෙහි මූලසර්වාස්තිවාදීන්ගේ විනයක්‍ෂුද්‍රකයෙහි ප්‍රථම සංගීතිකථාවෙහි සූත්‍ර -විනය - අභිධර්ම වශයෙන් ත්‍රිපිටකය සංගායනා කළ බව විස්තර වේ.[15]

බුද්ධදත්ත හිමියන් ත්‍රිපිටක සූචිය සම්පාදනය කිරීමේ දී සූත්‍ර, විනය, අභිධර්ම යන පිළිවෙළ සලකා ඇත.[16]

එසේ ම උන්වහන්සේගේ පාලි සාහිත්‍ය ඉතිහාසය කෘතියේ ද ත්‍රිපිටක පෙළගැස්මේ පළමු වැන්න ලෙස දක්වා ඇත්තේ සූත්‍ර පිටකය යි.[17]

මේ පිළිවෙළ මගින් ත්‍රිපිටකයේ ඓතිහාසික සංවර්ධනයේ අවස්ථා නිරූපණය වුවත් ථෙරවාදීහු එම පිළිවෙළ උල්ලංඝණය කොට විනය පිටකය මුලින් දැක්වූ බව පෙනේ. ථෙරවාද සම්ප්‍රදාය තුළ සෑම විට ම පාහේ විනයට පළමු තැන ලබා දීමේ ප්‍රයත්නයක් පැවැති බව සාසන ඉතිහාසය විමසීමෙන් පැහැදිලි වේ.[18]

වරක් සසුනේ පැවැත්මට ප්‍රධාන වශයෙන් ධර්මය හේතු වන්නේ ද විනය හේතු වන්නේ ද යන වාදය ඇති විය. එහි දී ධර්මය මූලික වන්නේ යැයි කියූ පිරිස ජය ලැබූ බව අටුවාවන් හි සඳහන් වේ.[19]

ත්‍රිපිටකය කටපාඩමේ පැවැති අවධියේ ප්‍රධාන වර්ග පංතිවල අනුපිළිවෙළ එතරම් වැදගත් නො වූවා විය හැකි. ඒ එක් එක් පිරිස් ඒවා වෙන් වෙන් වශයෙන් ධාරණය කළ බැවිනි. එහෙත් ත්‍රිපිටකය පුස්කොළ හෝ පොත් පත් වශයෙන් රාක්කගත කරන විට ප්‍රධාන වර්ග පංතිවල අනුපිළිවෙළ තීරණය කිරීම වැදගත් වේ. පුස්තකාල වර්ගීකරණ පද්ධතියක් වශයෙන් ත්‍රිපිටක වර්ගීකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ දී මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

22. වර්ගීකරණයේ ස්ථර තුන:

පුස්තකාල වර්ගීකරණ පද්ධතියක් නිර්මාණය කිරීමේ දී එහි පවත්නා ස්ථර තුනක් කෙරෙහි වර්ගීකරණඥයන්ගේ අවධානය යොමු කෙරේ. භාව තලය *(Idea Plane)*, වාග් තලය *(Verbal Plane)* හා අංකන තලය *(Notational Plane)* වශයෙන් හඳුන්වනු ලබන මේ ස්ථරවලට අදාළ සිද්ධාන්ත ගණනාවක් එස්.ආර්. රංගනාදන් විසින් සංග්‍රහ කරන ලදී.[20]

සම්පූර්ණ පුස්තකාල වර්ගීකරණ පද්ධතියක් බිහි වන්නේ මේ ස්ථර තුනට අදාළ කාර්යයන් පියවරෙන් පියවර අවසන් කළ පසු ය. ත්‍රිපිටක වර්ගීකරණය කෙරම් දුරකට මේ ස්ථර තුන අනුව විමසා බැලිය හැකි ද?

23. භාව තලය:

වර්ගීකරණ පද්ධති නිර්මාණයේ ප්‍රාථමික අවස්ථාව නම් භාව තලයට අයත් කාර්ය භාරය යි. වර්ගීකරණයේ මේ අවස්ථාව මූලික වශයෙන් ම සංකල්පීය නොහොත් මානසික ක්‍රියාවලියකි.




මෙය දැනුම සිතියම් ගත කරනු ලබන අවස්ථාව ලෙස සැලකේ. දැනුම් විශ්වයේ පවත්නා සමස්ත සංකල්ප පද්ධතිය ප්‍රභේද කොට හඳුනා ගැනීම භාව තලයේ දී සිදු කෙරේ. මේ සඳහා විෂය පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් වර්ගීකරණඥයා සතු විය යුතු ය. බුද්ධ වචනය වර්ගීකරණය කිරීමේ දී සියලු ම දේශනා පිළිබඳ දැනුමක් තෙරුන් වහන්සේලාට තිබිය යුතු විය. කොටස් වෙන් කෙරෙන විභේදක භාවිත කරමින් වර්ග පංති නිර්මාණය සැලසුම් කෙරෙන්නේ භාව තලයේදී ය. මේ නිසා විභේදක (characteristics) පිළිබඳ දැනුම ඉතා වැදගත් වේ. විභේදකවල සන්තිය (succession of characteristics), සමගාමී-වර්ග පංති (arrays of classes), වර්ග පංති දාමය(chain of classes) ආදි සාධක පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ රංගනාදන් විසින් මේ සංකල්ප පදනම් කර ගත් සිද්ධාන්ත ගණනාවක් ඉදිරිපත් කරන ලදී.

වර්ගීකරණයේ විභේදක භාවිතයේ දී ඒවායේ ගති ලක්ෂණ කිහිපයක් හඳුන්වා ඇත. ඒ අනුව විභේදක වෙනස පෙන්නුම් කරන්නක් විය යුතු ය. විභේදකයේ මේ වෙනස පෙන්නුම් කිරීමේ හැකියාව නිසා වර්ග පංති දෙකක් නිර්මාණය වේ. ගති ලක්ෂණ හෙවත් විභේදක පදනම් කර ගෙන සිදු කරන ලද සූත්‍ර වර්ගීකරණයක් ත්‍රිපිටකයේ දක්නට ලැබෙන බව ඉහතින් සාකච්ඡා කරන ලදී. විභේදක වර්ගීකරණයේ උපයෝගිතාවට අදාළ විය යුතුය යන්න තවත් සිද්ධාන්තය කි. ත්‍රිපිටකයේ විභේදක භාවිතය පිළිබඳ ඉහතින් සාකච්ඡා කරන ලද කරුණු අනුව කිසියම් දුරකට ඒවා වර්ගීකරණයේ අරමුණට අදාළ ව යොදා ගෙන ඇති බව පෙනේ.

බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
07 FEB 2014
පුස්තකාලය

### 24. සමගාමී වර්ග පංති (arrays of classes):




රූප සටහන් අංක 01


සමගාමී වර්ගපංතියක් යනු එක් විභේදකයකින් බෙදූ විට ලැබෙන පංති වේ. බුද්ධ දේශනාව පිටක අනුව බෙදූ විට වර්ග පංති තුනකට අන්‍යෝන්‍ය වශයෙන් වෙන් වේ. ඒ අනුව සූත්‍ර පිටකය, විනය පිටකය, අභිධර්ම පිටකය සමගාමී වර්ග පංතියකි. මෙහි තවත් වර්ග පංතියක් (සිව්වැනි පිටකයක්) තිබිය නො හැකි ය. එක් බෙදුම් පියවරක සියලු ම අනුබෙදීම්වල එකතුව පරිපූර්ණ විය යුතුය යන සිද්ධාන්තය මෙහි දී පෙන්නුම් කෙරේ. එනම්,

ත්‍රිපිටකය = සූත්‍ර පිටකය + විනය පිටකය + විනය පිටකය

සූත්‍ර පිටකය = දීඝ නිකාය + මජ්ඣිම නිකාය + සංයුත්ත නිකාය + අංගුත්තර නිකාය + කුද්දක නිකාය

වශයෙනි.

### 25. සහ-සමගාමී වර්ග පංති (collateral arrays):





රූප සටහන් අංක 02



සහ-සමගාමී වර්ග පංති තේරුම් ගැනීමට රූප සටහන් අංක 02 යොදා ගත හැකි ය. මෙහි නිකාය වශයෙන් දක්වූ වර්ග පංති පහ ද විනයේ විභංග, ඛන්ධක, පරිවාර යැයි දැක්වූ වර්ග පංති තුන ද අභිධර්මයේ ප්‍රකරණ වශයෙන් දක්වා ඇති ග්‍රන්ථ හත ද ඇතුළත් වර්ග පංති පෙළ සහ-සමගාමී වර්ග පංතියක් ලෙස දැක්විය හැකි ය. එහෙත් මෙහි වරදක් ඇත. සහ සමගාමී වර්ග පංතියක් නිර්මාණය වීමේ දී එක ම විභේදයක් භාවිත කොට බෙදීම කළ යුතු වේ. එහෙත් මේ අවස්ථාවේ දී විවිධ විභේදක භාවිත කොට ඇති බව කිව හැක.

ත්‍රිපිටක වර්ගීකරණයේ වර්ග පංති සංවිධානය වී ඇති ආකාරය පිළිබඳ නිදසුනක් රූප සටහන් අංක 03 හි දැක්වේ සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථයක් වන සංයුත්ත නිකායේ ආසන්න බෙදුම් ක්‍රමය වන්නේ වග්ග ක්‍රමය යි. ඒ අනුව සංයුත්ත නිකායේ සගාථ, නිදාන, ඛන්ධක, සළායතන හා මහා වශයෙන් නම් කරන ලද වග්ග පහකි. මේ වග්ග එක එකක් නැවත සංයුත්ත යැයි හඳුන්වනු ලබන වර්ග පංතිවලට බෙදනු ලැබේ. සගාථ වග්ගය තුළ දේවතා, දේවපුත්ත, කොසල, මාර යන නම් ලද සංයුත්ත වර්ග ඇතුළත් වේ. එම සංයුත්තයක් නැවත වග්ග වලට බෙදා ඇත. ඒ අනුව මාර සංයුත්තයේ ආයු, රජ්ජ හා මාර යැයි වග්ග තුනකි. එකී වග්ග තුළ සූත්‍ර පෙළ ගස්වා ඇත. ආයු වග්ගයේ තපොකම්ම, හත්ථිරාජ, සුභාසුභ, මාරපාස, සබ්බපාස, සප්පරාජ, සොප්පසි, පුත්තනන්දන, අප්පමායු හා අච්චයන්ති යන සූත්‍ර දහයක් ඇතුළත් වේ.

මේ අනුව කිසියම් සූත්‍රයක ස්ථානය සොයා ගැනීම සඳහා යායුතු පියවර පිළිවෙළින් දැක්විය හැකි ය. නිදසුනක් ලෙස සොප්පසි සූත්‍රය සූත්‍ර පිටකයේ සංයුත්ත නිකායේ සගාථ වග්ගයේ මාර සංයුත්තයේ ආයු වග්ගයේ හත් වැනි සූත්‍රය යැයි කිව හැකි ය.




රූප සටහන් අංක 03

**26. වාග් තලය:**

භාව තලයේ දී හඳුනා ගනු ලබන වර්ග පංති හැඳින්වීම සඳහා නියත පද මාලාවක් සම්පාදනය වාග් තලයේ කාර්යය යි. වර්ගීකරණ පද්ධතිය පාලනය කිරීමට හා භාවිත කිරීමට යොදා ගනු ලබන පදමාලාව ඉතා වැදගත් ය. වර්ගීකරණ ක්‍රමයක් සඳහා පද මාලාවක් සම්පාදනය සරල කටයුත්තක් නො වේ. එයට හේතුව සංකල්පයක් හැඳින්වීම සඳහා පද එකකට වඩා වැඩි සංඛ්‍යාවක් භාෂාවේ තිබිය හැකි වීම යි. වාක් කෝෂ තලයේ දී



සිදු වන්නේ හුදෙක් සංකල්ප නම් කිරීම පමණක් නො වේ. එහි දී සිදු වන්නේ වර්ගීකරණ පද්ධතිය තුළ සංකල්පය හැඳින්වීම සඳහා වඩාත් සුදුසු යැයි වර්ගීකාරකයා විසින් තීරණය කරනු ලබන පද තෝරා බේරා ගෙන භාවිත කිරීම යි.

වර්තමාන ව්‍යවහාරයේ මෙය වාක් කෝෂ පාලනය (vocabulary control) යනුවෙන් හැඳින් වේ. වාග් කෝෂ පාලනයෙන් වර්ගීකරණ පද්ධතියේ වාග් තලය යථාර්ථයක් බවට පත් වන අතර අදාළ සංකල්පවලට පැහැදිලි භාවයක් හා නිශ්චිතාර්ථයක් ලැබේ. වර්ගීකරණයේ පද මාලාව ප්‍රමිත, ප්‍රායෝගික පද මාලාවක් විය යුතු ය. භාෂාවේ වචන හා වර්ගීකරණයේ භාවිත වන වචන අතර සම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා පර්යාය පද කෝෂ, විෂය ශීර්ෂ ලැයිස්තු (subject heading lists) ආදිය භාවිත කෙරේ.

ත්‍රිපිටක වර්ගීකරණයේ සම්භාවිත වාග් මාලාවක් නිර්මාණය වී ඇත. දීඝ නිකාය, මජ්ඣිම නිකාය ආදී වශයෙන් හඳුන්වනු ලබන පද මාලාව සියලු දෙනාට පොදුවේ භාවිත කළ හැකි මට්ටමකට පත්ව ඇත. වර්තමානයේ වුව ද භාවිත කරන්නාට පිටකාගත ග්‍රන්ථයක් සොයා ගැනීමට හා පාලි වදනක් අර්ථ නිරූපනය කර ගැනීමට නියත වාග් මාලාව මේ නිසා බිහි වී ඇත. නිඝණ්ඩු, පද මාලා, ශබ්ද කෝෂ, අටුවා, ටීකා ආදී ග්‍රන්ථ වලින් පෝෂිත පාලි සාහිත්‍ය තුළින් ත්‍රිපිටකයේ වාග් කෝෂ පාලන (Vocabulary control) සිදු කර ඇති ආකාරය හඳුනා ගත හැකි ය.

ත්‍රිපිටක වර්ගීකරණ නිර්මාණයේ දී භාව තලයේ හා වාග් තලයේ දී කළ යුතු කාර්යයන් මැනවින් සිදු කොට තිබෙන බව මෙයින් පෙනී යයි. ඒ සාර්ථක වර්ගීකරණයක වැදගත් අදිරය දෙක වන බැවිණි. පළමුව, සංකල්පීය වශයෙන් ත්‍රිපිටක සාහිත්‍යය තර්කාන්විතව සැලසුම් කොට තිබේ. සමස්ත බුද්ධ වචන සංකල්පීය වශයෙන් විශ්ලේෂණය කිරීමේ දී ප්‍රධාන වර්ග

පංති තුනක් හඳුනා ගනු ලැබූ අතර ඒවා ද උප-බෙදුම් හා උප-උප-බෙදුම් ආදී වශයෙන් තාර්කාන්විත ලෙස අනුක්‍රමයෙන් බෙදා දැක්වීමට හැකි විය. පුළුල් සංකල්පයේ සිට සියුම් සංකල්පය දක්වා විෂය විශ්ලේෂණය කොට ත්‍රිපිටකයේ කොටස් පිළිවෙළින් තැබීමට මේ නිසා හැකිය. දෙවනුව, සංකල්ප හා වර්ග පංති නම් කිරීමේ දී විශේෂිත පද මාලාවක් හා භාෂාවක් භාවිත කරන ලදී. එම සංකල්ප විස්තර කරන නිශ්චිත, අර්ථවත්, තාක්ෂණික පද මාලා, කෝෂ ග්‍රන්ථවලින් පාලි සාහිත්‍ය පෝෂිත වේ.

## 27. අංකන තලය:

කිසියම් වර්ගීකරණයක් පුස්තකාල භාවිතයට ගැනීමට නම් එහි අංකනය (notation) අත්‍යවශ්‍ය සාධකය වේ.[21] වර්ගීකරණය කරනු ලබන විෂය නාම කෘතිම භාෂාවක් බවට නැතහොත් යාන්ත්‍රික භාෂාවක් බවට පත් වන්නේ අංකනය මගිනි. වර්ග පංතියේ ගුණාංග නියෝජනය කිරීම, පංති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පෙන්නුම් කිරීම හා වර්ගීකරණ පද්ධතිය පාලනය කිරීම සඳහා අංකනය වැදගත් වේ. එසේ ම නව සංකල්පයක් වර්ගීකරණ පද්ධතියේ පංති අතර නිවැරදිව ස්ථානගත කිරීමට ද අංකනය උපකාර වේ. පුස්තකාලයේ ප්‍රලේඛන රාක්කවල නියත ස්ථානයක තැබීම, විමර්ෂණය, තොරතුරු ගවේෂණය, විෂයන් අන්තර්ග්‍රහණය ආදී ප්‍රයෝජන ලබාගැනීමේ හැකියාව ඇත්තේ අංකන භාවිතයෙනි.

ලේඛනගත දැනුමක් සංවිධානය කිරීම සඳහා වැදගත් වන්නේ අංකන පද්ධතියක් ඇති පුස්තකාල වර්ගීකරණ ක්‍රමයකි. ත්‍රිපිටකය වාචික දැනුම් සම්භාරයක් වූ බැවින් එම වර්ගීකරණ ක්‍රමයට පුස්තකාල වර්ගීකරණය පද්ධතියක මෙන් අංකනයේ අවශ්‍යතාවක් නො වී ය. එය භෞතික වශයෙන් රාක්කගත කිරීමේ හැකියාවක් හෝ අවශ්‍යතාවක් නොමැති බැවිනි. එහෙත්



මුල පටන් ත්‍රිපිටකය ලේඛනගත කරනු ලැබුවේ නම් උන්වහන්සේලා නිසැක වශයෙන් ම අංකය පද්ධතියක් මේ සඳහා පහසුවෙන් යොදා ගනු ඇත. එසේ අංකන පද්ධතියක් යෙදීමට අවකාශ සැලසුනේ නම් දැනට පෙනෙ අඩුපාඩුකම් සිදු නො වන්නටත් ඉතා දියුණු පුස්තකාල වර්ගීකරණයක් නිර්මාණය වන්නටත් ඇති තරම් අවකාශ තිබිණි.

කෙසේ වුත් අතීතයේ පැවැති පොත්ගුල්වල පුස්කොල පොත් වර්ග කිරීම සඳහා කිසියම් අංකන පද්ධතියක් සහිත වර්ගීකරණයක් භාවිතා වන්නට ඇත. අද වුව ද අවශ්‍ය නම් ත්‍රිපිටක වර්ගීකරණය ක්‍රමයට පහසුවෙන් අංකන පද්ධතියක් ආරෝපණය කළ හැකි වී තිබේ. වර්ගීකරණයේ මූලික කාර්යයන් සිද්ධ වී ඇති විටෙක අංකන පද්ධතියක් යෙදීම ඉතාමත් පහසු කාර්යයකි. ඒ අනුව තමා විසින් තීරණය කරගත් අංකන පද්ධතියක් අභිමතය පරිදි මේ සඳහා භාවිත කිරීමට හැකි වී තිබේ. නිදසුනක් ලෙස ත්‍රිපිටකයේ උපලේඛනය (schedule) අංකනය කිරීම පහත දැක්වෙන පරිදි සිදු කළ හැකි ය.

## 28. ත්‍රිපිටකයේ වර්ග පංති දාමය හා අංකනයේ භාවිතය (chain of classes and notation)

1 ත්‍රිපිටකය

11 සූත්‍ර පිටකය

111 දීඝ නිකාය

1111 සීලක්ඛන්ධ වග්ගය

1112 මහාවග්ගය

11121 මහාපදාන සුත්‍රය

11122 මහානිදාන සුත්‍රය

1113 පාථික වග්ගය

112 මජ්ඣිම නිකාය
- 1121 මූල පණ්ණාසකය
  - 11211 මූල පරියාය වග්ගය
  - 11212 සීහනාද වග්ගය
  - 11213 ඕපම්ම වග්ගය
    - 112131 කකචූපම සූත්‍රය
    - 112132 අලගද්දූපම සූත්‍රය
    - 112136 අරියපරියේසන සූත්‍රය
  - 11214 මහා යමක වග්ගය

වර්ගීකරණය පිළිබඳ ඉදිරිපත් කර ඇති සිද්ධාන්ත කිහිපයක් භාවිත කරමින් ත්‍රිපිටකාගත වර්ගීකරණය පිළිබඳ කරන ලද මේ විමර්ශනය සම්පූර්ණ වුවක් නො වේ. එය තවදුරටත් විමසා බැලිය යුතු කරුණු ගණනාවකින් යුත්ත වන අතර මතු විය හැකි ගැටලු ද බොහෝ ය. ත්‍රිපිටකාගත වර්ගීකරණ පද්ධතිය ඇසුරින් නූතන පුස්තකාලවල බෞද්ධ සාහිත්‍ය වර්ග කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් ඇති කොට ඒ සඳහා කළ යුතු පර්යේෂණ පිළිබඳ අවධියක් ඇති කිරීමේ කාලීන වැදත්කමක් ඇත. මේ ප්‍රයත්නය එවැනි කාර්ය භාරයකට මුල පිරීමකි.

## විමර්ශන ග්‍රන්ථ


1 Satija, M.P., Classification, In Library and Information Science, vol. 1, edited by R.G. Presher, New Delhi: Concept Publishing Company, 1997, p. 326

2 Krishan Kumar, Theory of classification, New Delhi: Vikas,1991, p.376

3 පද්මසිරි, පී.ආර්., පුස්තකාල වර්ගීකරණය, ඒකල, කර්තෘ, 2003, පි. 34,35

4 Styanarayana, V. V. V, Universal Decimal Classification: A practical primer, New Delhi: Ess Ess Publication, 1998 p.vii





5 මාරසිංහ, වෝල්ටර්, වර්ගීකරණය පිළිබඳ සිද්ධාන්ත, පුස්තකාල විද්‍යාව: සද්ධර්මාකර ශාස්ත්‍රීය ලිපි සරණිය, පානදුර: සද්ධර්මාකර විද්‍යායතන පිරිවෙණ, 1994 පි. 115

6 එම, පි. 117

7 Suraj, V.K., Encyclopaedic Dictionary of Library and Information Science,vols.3, Delhi: Isha Books, 2005, p.116

8 සිංහල සමන්තපාසාදිකාව, 1 කාණ්ඩය, පරි. අම්බලන්ගොඩ ධම්මකුසල හිමි, කොළඹ 7: ස්වර්ණමාලි මඬගලිකා ගුණතුඬග, 1975, පි.20

9 රණසිංහ, පියදාස, පරි. ඩිවි දශම වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය, රාගම: කර්තෘ, 2011, පි.57

10 දීඝනිකාය අට්ඨකථා සිංහල, දෙහිවල: බෞ.ස.ම., 2005, පි. 26

11 විමලකිර්ති හිමි, මැදඋයන්ගොඩ, ශාසන වංශ ප්‍රදීපය, මාතර: මාතර වෙළෙන්දෝ, බු.ව.2498, පි.25

12 දීඝනිකාය 3, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවල: බෞ.ස.ම, 2005, පි.352-462

13 Dewey Decimal Classification and Relative Index, 4 vols., 20th ed.,by John P. Comaromi et. al, New York: Forest Press, 1989

14 රණසිංහ, පි. 276

15 මහාවග්ගපාලි 1, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවල: බෞ.ස.ම., 2005, පි.L

16 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, ත්‍රිපිටක සූචිය, දෙහිවල: බෞ.ස.ම., 2000

17 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, පාලි සාහිත්‍ය, කොළඹ: රත්න පොත්, 1966

18 සිංහල සමන්තපාසාදිකාව පි.51-53

19 වජිරඤාණ හිමි, හොරණ, ලක්දිව විනය සාහිත්‍ය, කොළඹ: එස්.ගොඩගේ, 2000, පි.43-47

20 Krishan Kumar,Theory of Classification, New Delhi: Vikas,1979, p.108-175

21 සුරවීර, නාමලී, අංකනයේ ගුණාංග හා කාර්යයන් පිළිබඳ විමර්ශනාත්මක විග්‍රහයක්, පුස්තකාලවිද්‍යා, කැලණිය: පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 2008, 5 (1) පි.37